## 22. ශීර්ෂය 22 - පරිපාලන කටයුතු පිළිබඳ පාර්ලිමේන්තු කොමසාරිස්තුමාගේ කාර්යාලය

### 22.1 විගණන විෂය පථය

පරිපාලන කටයුතු පිළිබඳ පාර්ලිමේන්තු කොමසාරිස්තුමාගේ කාර්යාලයේ 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මුල්‍ය වාර්තා, සැසඳුම් ප්‍රකාශන පොත් පත්, ලේඛන හා අනෙකුත් වාර්තා අන්තර්ගත වූ විසර්ජන ගිණුම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන යටතේ විගණනය කරන ලදී. සමාලෝචිත වර්ෂය සඳහා වූ කළමනාකරණ විගණන වාර්තාව 2013 ජුනි 06 දින කොමසාරිස්වරයා වෙත නිකුත් කරන ලදි. ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ විගණන නිරීක්ෂණ, අදහස් දැක්වීම් සහ සොයා ගැනීම්, විගණනය සඳහා ඉදිරිපත් කරන ලද ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ සමාලෝචනය සහ ගනුදෙනුවල නියැදි පිළිබඳ තහවුරු පරීක්ෂා කිරීම් මත පදනම් වී ඇත. එම සමාලෝචනය හා පරීක්ෂණයන්ගේ විෂය පථය සහ ප්‍රමාණය, මට ලැබී ඇති කාර්ය මණ්ඩලය, අනෙකුත් සම්පත් හා කාල වේලා යන සීමාවන් ඇතුලත හැකිතාක් පුළුල් විගණනයක් කළ හැකි වන පරිදි පිළියෙල කරන ලද්දකි.

### 22.2 ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකීම

විසර්ජන ගිණුම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148,149,150 හා 152 ව්‍යවස්ථාවන්, වෙනත් ව්‍යවස්ථාපිත විධිවිධානයන්, රාජ්‍ය මුල්‍ය හා පරිපාලන රෙගුලාසිවලට අනුකූලව පවත්වා ගෙන යාම, පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරී වගකීම වේ. වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන අභ්‍යන්තර පාලනයන් සැලසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම සහ පවත්වා ගෙන යාමත් මෙම වගකීමට ඇතුලත් වේ.

### 22.3 විගණන නිරීක්ෂණය

2012 දෙසැම්බර් 31 දිනට මුල්‍ය වාර්තා හා පොත් අනුව කාර්යාලයේ විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශනය මෙහි (අ) සිට (ඇ) දක්වා වූ පොදු නිරීක්ෂණ සහ පහත 22.4 සිට 22.6 දක්වා ඡේදවල සඳහන් ප්‍රධාන විගණන සොයා ගැනීම් හැර සතුටුදායක ලෙස පිළියෙල කර ඇති බව නිරීක්ෂණය විය.

**(අ) ගිණුම් ඉදිරිපත් කිරීම**

කාර්යාලය විසින් 2013 මාර්තු 31 දින වන විට පහත සදහන් ගිණුම් විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

| ශීර්ෂය / විෂය අංකය | ගිණුමේ නම |
| --- | --- |
| 22 | විසර්ජන ගිණුම |
| 02201 | රජයේ නිලධාරීන්ට අත්තිකාරම් පිළිබඳ සැසදුම් ප්‍රකාශනය |

**(ආ) ලේඛන හා පොත්පත් පවත්වා නොතිබීම**

කාර්යාලය විසින් 1978 දෙසැම්බර් 19 දිනැති අංක 842 දරන භාණ්ඩාගාර චක්‍රලේඛයේ විධිවිධාන ප්‍රකාරව ස්ථාවර වත්කම් ලේඛණයක් පවත්වා ගෙන ගොස් නොතිබුණි.

**(ඇ) රාජ්‍ය වියදම් කළමනාකරණය**

2012 වර්ෂය සඳහා පාර්ලිමේන්තුව විසින් අනුමත කරන ලද වාර්ෂික අයවැය ඇස්තමේන්තු මගින් සලසා තිබුණු ප්‍රතිපාදන වලින් 2011 දෙසැම්බර් 30 දිනැති අංක 155 දරන ජාතික අයවැය චක්‍රලේඛය ප්‍රකාරව වාර්ෂික අයවැය ඇස්තමේන්තුවේ සලසා තිබුණු පුනරාවර්තන ප්‍රතිපාදනවලින් සියයට 2 ක ප්‍රතිපාදන ඉතිරි කළ යුතු වුවත්, කාර්යාලය විසින් පුනරාවර්තන ප්රතිපාදනවලින් සියයට 0.78 ක ප්‍රතිශතයක් පමණක් ඉතිරි කර තිබුණි.

**(ඈ) රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම පිළිබඳ සැසඳුම් ප්‍රකාශය**

(i) විෂය අංක 02201 දරන රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම පිළිබඳ 2012 දෙසැම්බර් 31 දිනට සැසදුම් ප්‍රකාශය ප්‍රකාරව එදිනට අයවිම් හිඟ හිට තිබුණු ශේෂවල එකතුව රු.62,988 ක් විය.

(ii) දෙපාර්තමේන්තු පොත් හා භාණ්ඩාගාර පරිගණක වාර්තා අනුව වර්ෂ 15ක සිට රු.4,921 ක වෙනසක් පැවතුණු අතර සමාලෝචිත වර්ෂයේදීද මෙය නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි.

(iii) කේවල ශේෂ වර්ගීකරණ සාරාංශයේ එකතුව හා පාලන ගිණුමේ ශේෂය අතර රු.36,758 ක වෙනසක් පැවතුණි.

**22.4 යහපාලනය හා ගිණුම්කටයුතුභාවය**

**------------------------------------**

**22.4.1 අභ්‍යන්තර විගණනය**

**--------------------**

අභ්‍යන්තර විගණන ඒකකයක් ස්ථාපිත කර නොතිබුණි.

**22.4.2 විගණන හා කළමනාකරණ කමිටු ක්‍රියාත්මක කිරීම**

**-------------------------------------------------**

විගණන හා කළමනාකරණ කමිටු ස්ථාපිත කර නොතිබුණි.

**22.5 වත්කම් කළමනාකරණය**

**------------------------**

**(අ) වාර්ෂික භාණ්ඩ සමීක්ෂණ පැවැත්වීම**
**-------------------------------------**

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) 2010 දෙසැම්බර් 17 දිනැති අංක පීඑෆ්/සමීක්ෂණ මණ්ඩල/01 දරන රාජ්‍ය මුදල් අධ්‍යක්ෂ ජනරාල්ගේ ලිපිය මගින් සංශෝධිත 2009 දෙසැම්බර් 09 දිනැති අංක 441 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාර 2012 වාර්ෂික භාණ්ඩ සමීක්ෂණය සිදු කර එම වාර්තා 2013 මාර්තු 31 දිනට ප්‍රථම විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතු වුවත්, කාර්යාලය විසින් එම වාර්තා 2013 මැයි 31 දින වන විටත් විගණනය වෙත ඉදිරිපත් කර නොතිබුණි. අවසාන වශයෙන් භාණ්ඩ සමීක්ෂණය පවත්වා තිබුණේ 2011 වර්ෂය වෙනුවෙනි.

(ii) 2011 වර්ෂයට අදාල සමීක්ෂණ මණ්ඩල වාර්තාවලින් පෙන්වා දී තිබුණු ඌනතා සම්බන්ධයෙන් හා වෙනත් නිර්දේශ සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි හා 2009 නොවැම්බර් 13 දිනැති අංක 438 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ විධිවිධාන පරිදි කටයුතු කර නොතිබුණි.

**(ආ) බේරුම් නොකළ බැරකම්**

-------------------------

2012 දෙසැම්බර් 31 දිනට කාර්යාලයේ බේරුම් නොකළ බැරකම් රු.51,614 ක් වු අතර, ඒවා වසරකට අඩු කාල පරිච්ඡේදයකට අදාල විය.

**22.6 මානව සම්පත් කළමනාකරණය**

------------------------------

**අනුමත සේවක සංඛ්‍යා හා තථ්‍ය සේවක සංඛ්‍යා**

----------------------------------------------

2012 දෙසැම්බර් 31 දිනට වු සේවක සංඛ්‍යාව පිළිබඳ තත්ත්වය පහත පරිදි විය.

| සේවක වර්ගය | අනුමත සේවක සංඛ්‍යාව | තථ්‍ය සේවක සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව |
|---|---|---|---|
| (අ) ජ්‍යෙෂ්ඨ මට්ටම | 1 | 1 | - |
| (ආ) ද්විතීයික මට්ටම | 2 | 1 | 1 |
| (ඇ) තෘතියික මට්ටම | 18 | 9 | 9 |
| (ඈ) ප්‍රාථමික මට්ටම | 8 | 2 | 6 |
| (ඉ) වෙනත් (අනියම්/ තාවකාලික/ කොන්ත්‍රාත් පදනම) | 1 | 1 | - |
| එකතුව | 30 | 14 | 16 |

සමාලෝචිත වර්ෂය අවසාන වන විට පුරප්පාඩු 16 ක් පිරවීමට කාර්යාලය කටයුතු කර නොතිබුණි.